එලෙස ලැබෙන අයදුම්පත් සඳහා DAD/PLF/01 ආකෘතියේ තුන්වන කොටස උපයෝගී කර ගනිමින් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට සම්බන්ධ තාක්ෂණ නිළධාරියෙකු වෙත ඉදිරිපත් කර තාක්ෂණ නිර්දේශ ලබාගත යුතු අතර, යෝජිත ඉඩමේ බිම් ප්‍රමාණය පර්චස් 10 ඉක්මවන්නේ නම්, ඒ සඳහා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ නිර්දේශය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.ඉන්අනතුරුව අයදුම්පත ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ ස්ථාපිත කොට ඇති පහත සඳහන් සාරා දිස්ත්‍රික් තාක්ෂණ කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කල යුතු වේ.

| | |
|---|---|
| කමිටුවේ කැඳවුම්කරු | - දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් |
| ලේකම් | - දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික මට්ටමෙ නිළධාරියෙක් |
| සාමාජික | - පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් නම්කරනු ලබන නිළධාරින් |
| සාමාජික | ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන කිරීමේ සංස්ථාවේ නිළධාරියෙකු |
| සාමාජික | - මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරියෙකු |
| සාමාජික | - නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරියෙකු |
| සාමාජික | - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිළධාරියෙකු |
| සාමාජික | - අදාල පළාත් පාලන ආයතනයේ නිළධාරියෙකු |

ඉහත සඳහන් නිලධාරීන්ට අමතරව, වෙනත් ආයතන වලින් ද නියෝජිතයින් සහභාගී කර ගැනීමට අවශ්‍ය කරන්නේ නම්, දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් ඒ අනුව ක්‍රියා කළ හැකි අතර, එසේ අමතරව සහභාගි කරගන්නා නිලධාරීන් හා සාකච්ඡා පිළිබඳව නොපමාව මා දැනුවත් කළ යුතුවේ.

ඒ සඳහා ඉහත සාමාජිකයින්ගේ නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව අයදුම්පත දිස්ත්‍රික් භාර නියෝජ්‍ය සහකාර කොමසාරිස්වරුන්ගේ නිර්දේශයද සහිතව මා වෙත ඉදිරිපත් කල යුතු අතර, අදාල ඉඩමේ බිම් ප්‍රමාණය පර්චස් 10 ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මා වෙත ඉදිරිපත් කල යුතුය.
එලෙස ලැබෙන අයදුම්පත් වලින් පර්චස් 10 හෝ 10 ට අඩු අයදුම්පත් සඳහා ලැබී ඇති නිර්දේශ සැලකිල්ලට ගෙන, මා විසින් අදාල බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

බිම් ප්‍රමාණය පර්චස් 10 ට වැඩි කුඹුරු ඉඩම් කෘෂිකාර්මික නොවන වෙනත් කාර්යයකට යොදා ගැනීම අනුමත කිරීම සඳහා වන අයදුම්පත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කර අමාත්‍ය තාක්ෂණ කමිටුවේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුව අදාල අවසරපත්‍රය මා විසින් නිකුත් කරනු ඇත.

පහත විස්තර කෙරෙන කුඹුරු ඉඩම් ගොඩකිරීම සඳහා / කෘෂිකාර්මික නොවන වෙනත් කාර්යයක යෙදවීම සඳහා අවසර ලබාදීම නොකල යුතුය.

I. නැවත වී වගා කලහැකි හෝ මේ වන විටත් වී වගා කරනු ලබන කුඹුරු ඉඩම්.
II. වැව් බැම්මක රක්ෂිතයට යාබදව පවතින පුරන් කුඹුරු.
III. කමතක් වශයෙන් භාවිතා කරන හෝ භාවිතා කල ඉඩමක්.
IV. කුඹුරු ඉඩම් නාමලේඛණ සංශෝධන ක්‍රියාවලියේදී A ඛාණ්ඩයට ඇතුලත් පුරන් කුඹුරු.
V. කුඹුරු යායක් මැද පිහිටි පුරන් කුඹුරු.
VI. ජල මූලාශ්‍රයකට අදාල රක්ෂිත/ප්‍රේරණ කලාප / සංරක්ෂිත කලාපයක පිහිටි පුරන් කුඹුරු.
VII. මෙවන විටත් සක්‍රියව පවතින කුඹුරු යායකට යාබදව ඇති දෙනිය, ඔවිට, පිල්ලෑව ආදි ලෙස නම් කර ඇති තෙත් බිම්.
VIII. වෙනත් රාජ්‍ය ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද විශේෂ බලප්‍රදේශයක හෝ ප්‍රේරණ කලාපයක් තුල පිහිටා ඇති කුඹුරු ඉඩම්.

ඉහත VIII හි සඳහන් යම් රාජ්‍ය ආයතනයක් විසින් ප්‍රකාශයට පත්කරන ලද විශේෂ බලප්‍රදේශයක පිහිටි කුඹුරු ඉඩම් ගොඩ කිරීම හෝ කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා යොදාගැනීමට ඉදිරිපත් වන ඉල්ලීම් වෙතොත්, ඒ සඳහා අදාල රාජ්‍ය ආයතනයේ, ආයතන ප්‍රධානියාගේ එකඟතාවය හා කොන්දේසි ලබා ගැනීම ප්‍රථමයෙන්ම සිදුකල යුතුව ඇති බැවින්, ගොවි සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත ඉදිරිපත් වන ඉහත අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිළධාරියාගේ/ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයාගේද නිර්දේශය සහිතව ඊට අදාල විශේෂ සටහනක් සමඟින් මාවෙත ඉදිරිපත් කලයුතු වේ. අදාල රාජ්‍ය ආයතනය මෙම ඉල්ලීම සඳහා එකඟතාවය ප්‍රකාශ කරන්නේ නම් පමණක් මේ යටතේ ඉදිරි කටයුතු සිදුකිරීමට මවිසින් ක්‍රියා කරනු ඇත.කෙසේ වුව ද, මෙවැනි අවස්ථාවකදී අදාල ඉල්ලීම සම්බන්ධයෙන් වන සම්බන්ධීකරණය හා අවසාන තීරණය ගැනීමේ වගකීම විශේෂ බලප්‍රදේශයේ වගකීම භාරව ක්‍රියාකරනු ලබන රාජ්‍ය ආයතනය වෙත පැවරෙනු ඇත.

2015/2017 වර්ෂවල ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික (කුඹුරු) ඉඩම් ප්‍රතිශෝධන වැඩසටහනේදී හඳුනාගත් පුරන් කුඹුරු අතුරින් B හා C වර්ගයට ගැනෙන පුරන් කුඹුරු සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛ උපදෙස් අදාල වන අතර, ඇමුණුම - 1 හි සඳහන් අවශ්‍යතා මූල්කර ගනිමින් සිය අයදුම්පත් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකියාව ඇත.

තමාට හෝ තම දරුවකු සඳහා නිවසක් තැනීම වෙනුවෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවලදී අදාල තැනැත්තාට නිවසක් නොමැති බව හා නිවසක් ඉදිකිරීමට සුදුසු වෙනත් ගොඩ ඉඩමක් ඔහු සතුව නොමැති බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා හා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කළ යුතුය. (ආකෘතිය - 3 අනුව)

විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් වන යෝජනා අදාල රාජ්‍ය ආයතනයේ නිර්දේශ සහිත විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් ද සමඟින් තම අයදුම් පත ඉදිරිපත් කළ යුතු අතර, ව්‍යාපාර සඳහා වන යෝජනා සම්බන්ධයෙන් නම් ඊට අදාල රාජ්‍ය ආයතන වල නිර්දේශ අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

පරිසර හිතකාමී ව්‍යාපෘති යෝජනා සඳහා (උදා: වන වගා ව්‍යාපෘති) ඉහල ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු අතර, වගකීම දරනා අදාල රාජ්‍ය ආයතනයේ නිර්දේශ සහිත ව්‍යාපෘති වාර්තාවක් අදාල යෝජනා පත්‍රය සමඟින් ඉදිරිපත් කිරීමට අයදුම්කරු විසින් ක්‍රියාකල යුතුවේ.

කෙසේ වුවද, ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන්, එම තීරණය අදාල අයදුම්කරු වෙත ලිඛිතව දැනුම්දීමට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී හෝ දිස්ත්‍රික් භාර නියෝජ්‍ය සහකාර කොමසාරිස්වරයා විසින් ක්‍රියා කලයුතු අතර, එසේ ප්‍රතික්ෂේප වන අයදුම්පත් සඳහා අභියාචනයක් ඉදිරිපත් කිරීමට අයදුම්කරු අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා වන ලිඛිත අභියාචනා අදාල සාධක තහවුරු කරන ලේඛන වල පිටපත් ද සමඟින් අයදුම්පත ප්‍රතික්ෂේප වී මාස 03 ක් ඇතුලත මා වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කල යුතු වේ.

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලිපි ලේඛනවල අඩුපාඩුකම් වෙතොත්, ඒවා නිවැරදි කොට ඉදිරිපත්කරන ලෙස අයදුම්කරුට දැනුම්දිය යුතු මුත්, අවශ්‍ය නිර්දේශ නොලැබීම නිසා ප්‍රතික්ෂේප වන අයදුම්පත් වෙනුවට නව අයදුම්පත ඉදිරිපත් කිරීමේ ඉඩකඩක් අයදුම්කරුට නොමැති බව වැඩිදුරටත් සඳහන් කරමි.

එසේම මෙම චක්‍රලේඛ උපදෙස් සම්බන්ධයෙන් යම් අර්ථවිග්‍රහයක් හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය වන අවස්ථාවලදී, ඊට අදාළ උපදෙස් මා වෙතින් සෘජුවම ලබාගත යුතු බව අවධාරණය කරමි. මේ සම්බන්ධයෙන් මෙතෙක් ලබා දී ඇති සියළුම චක්‍රලේඛ උපදෙස් මෙම චක්‍රලේඛය නිකුත් වීමෙන් පසුව අවලංගු වන බව වැඩි දුරටත් සඳහන් කරමි.

කුඹුරු ඉඩම් ආරක්ෂා කර ගැනීම හා පුරන් කුඹුරු නැවත වගාකරලීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය භාරයක් වන අතර, අතිවිශේෂ අවස්ථාවලදී පමණක්, අනෙකුත් කුඹුරු ඉඩම් වලට හෝ පරිසරයට හෝ වගා කටයුතු වලට බාධා නොපැමිණෙන අයුරින් ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වෙත පැවරී ඇති සුවිශේෂී වගකීමක් වන බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත්:
1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
3. ලේකම්, පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
4. රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
7. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
8. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
9. සභාපති, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යාංශය
10. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
11. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - මේ සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
12. සියලුම පළාත් කෘෂිකර්ම ලේකම්වරුන් වෙත
13. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වෙත
14. සියලුම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත
15. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත
16. සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත

## 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අනුව කුඹුරු ඉඩම් වගා කිරීමක් හැර වෙනත් කාර්යයක් සඳහා භාවිතා කිරීමට/ගොඩ කිරීමට අවසර ලබා ගැනීමේදී අනුගමනය කලයුතු ක්‍රියා පරිපාටිය

අදියර 01

01. වී වගා කලහැකි හෝ වී වගා කරනු ලබන කුඹුරු ඉඩම් ගොඩ කිරීමක් වෙතොත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීමට මේ යටතේ අවසර ලබාදෙනු නොලැබේ.

02. කුඹුරු ඉඩම් වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට/ගොඩ කිරීමට අවශ්‍ය පුද්ගලයින් පළමුවෙන්ම රු. 500/= ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව DAD/PLF/01 (පළමු කොටස) ආකෘතිය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා ගත යුතුය.)

03. ඉල්ලුම්කරු විසින් අයදුම් පත්‍රයේ පලමුවන කොටස සම්පූර්ණ කර ගොවි සංවිධානයේ නිර්දේශ හා ග්‍රාම නිළධාරිවරයාගේ නිර්දේශය සහිතව ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ආපසු ලබාදිය යුතුය.
මෙම ඉඩම සඳහා අදගොවියෙකු සිටිනම් ගොවිජන සේවා මධ්‍යස්ථානයට භාරදීමට පෙර එම් අදගොවියාගේ එකඟතාවයද එම ආකෘතිපත්‍රය මගින් ලබා ගැනීමට ක්‍රියා කල යුතුයි

04. එසේ ඉදිරිපත්වන අයදුම්පත සඳහා අදාල කෘ.ප.නි.ස. වරයාගෙන් උපදෙස් ලබාගැනීමට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී විසින් ක්‍රියා කාල යුතු අතර,ඉන් අනතුරුව මෙයට අදාල DAD/PLF/02 ආකෘතියේ දැක්වෙන දැන්වීම කෘ.ප.නි.ස. වරයා විසින් අවම වශයෙන් සති 02 ක කාලයක් කුඹුරු ඉඩමේ හා අදාල ස්ථානවල පැහැදිලිව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කල යුතුය.

05. දැන්වීම ප්‍රදර්ශනය කිරීම පිළිබඳව විරෝධතා පිළිබඳ සැලකිල්ලක් දක්වමින් ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි විසින් තම නිර්දේශය ඉදිරිපත් කල යුතුය.

06. ඉන් අනතුරුව ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගෙන් නිර්දේශ ලබා ගැනීමටත්, ඉන් අනතුරුව මෙම ඉඩම පෞද්ගලිකව පරීක්ෂා කොට බලා සිය නිර්දේශ ලබාදීමටත්, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීයය නිළධාරි විසින් ක්‍රියාකල යුතුය.

07. ඉන් අනතුරුව යෝජනා පත්‍රය ගොවිජන සේවා කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව නිර්දේශ කරන නොකරන බව තීරණය කර, එම තීරණය ඉල්ලුම්කරුට දැනුම් දිය යුතුය.

අදියර 02

01. අයදුම්කරුවෙකුට යෝජනා පත්‍රයට ලැබී ඇති නිර්දේශයට අමතරව පහත දැක්වෙන මූලික සුදුසුකම් තිබිය යුතුය.

I. නිවසක් තැනීමට නම් අයදුම්කරුට නිවසක් හෝ නිවසක් තැනීමට සුදුසු වෙනත් ගොඩ ඉඩමක් නැති බවට ග්‍රාම නිළධාරිවරයා ප්‍රාදේශිය ලේකම්වරයාගේ සහතිකයක් අවශ්‍ය වේ. (DAD/PLF/01 ආකෘතිය, පළමු කොටස, 6 ඡේදය)

II. ව්‍යාපාරික ස්ථානයක් සඳහා නම් ඒ සඳහා සුදුසු වෙනත් ඉඩමක් අයදුම්කරුට නොමැති බවට ප්‍රාදේශිය ලේකම්ගේ සහතිකයක් අවශ්‍යය.

III. වෙනත් ව්‍යාපෘතියක් සඳහා නම් අදාල ආයතනයේ නිර්දේශය සමග ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.වන වගා ව්‍යාපෘති ආදී පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

IV. ප්‍රවේශ මාර්ගයක් සඳහා නම් ගොඩ ඉඩමට ප්‍රවේශ වීමට වෙනත් සුදුසු මාර්ගයක් නොමැති බව ප්‍රදේශයේ ග්‍රාම නිළධාරි විසින් ද සහතික කල යුතුය.කෙසේ වුවද,

ප්‍රවේශ මාර්ග සඳහා අවසර ලබාදීම සම්බන්ධයෙන් මෙයට අමතර වෙනමම විකල්ප උපදෙස් නිකුත් කිරීමට ඉදිරියේදී ක්‍රියා කරනු ඇත.

v. පරිසර හිතකාමී ව්‍යාපෘති (උදා: වන වගා ව්‍යාපෘති) සඳහා ඉහත ප්‍රමුඛතාවයක් ලබාදීමට ක්‍රියා කල යුතුවේ.

vi. ගොවිජන සේවා කාරක සභාව විසින් නිර්දේශ කිරීමෙන් අනතුරුව අදාල අයදුම්පත සම්බන්ධයෙන් ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය ලබා ගැනීමට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරි විසින් ක්‍රියා කලයුතු වේ.

අදියර 03

ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු ඉල්ලුම්පත්‍රය ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී විසින් දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කල යුතුය.

දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා විසින් යෝජිත ඉඩම් ගොඩකිරීම හෝ කුඹුරු ඉඩම් වෙනත් කාර්යයක් සඳහා යෙදවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්ත තාක්ෂණ නිළධාරීගේ නිර්දේශය ලබාගත යුතු අතර, සංවර්ධනයට යෝජිත ඉඩම් ප්‍රමාණය පර්චස් 10 ඉක්මවන්නේ නම්, ඒ සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුගේ නිර්දේශය ලබාගත යුතු අතර, එම ඉඩම් පෞද්ගලිකව පරික්ෂා කිරීම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් විසින් ක්‍රියා කල යුතු වේ.

මෙම ඉල්ලුම්පත සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත නොහැකි නම්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් විසින් ඒ බව අයදුම්කරු වෙත ලිඛිතව දන්වා එවිය යුතුය.

යෝජිත බිම් ප්‍රමාණය පර්චස් 10 ඉක්මවන අවස්ථාවලදී පමණක් ඒ සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබාගැනීම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් විසින් ක්‍රියා කරනු ලැබේ.

ඉන් අනතුරුව අදාල යෝජනා පත්‍රය තම නිර්දේශයද සහිතව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කල යුතුය.

අදියර 04

ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් විසින් අදාල ඉල්ලුම්පත්‍ර දිස්ත්‍රික්කය තුල ස්ථාපිත කර ඇති දිස්ත්‍රික් තාක්ෂණ කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතුය.

අදාල නිර්දේශ ලබා ගැනීමෙන් පසුව ඉල්ලුම්පත්‍රය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය ලබා ගැනීමෙන් පසුව සංවර්ධනයට යෝජිත ඉඩම පර්චස් 10ට වැඩි නම්, ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් විසින් අදාල ඉල්ලුම්පත්‍රය ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය.

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පර්චස් 10 හෝ 10ට අඩු වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට වන ඉල්ලීම් ප්‍රධාන කාර්යාලය හරහා ලබා දීමට කටයුතු කරන අතර, පර්චස් 10 ට වඩා වැඩි ඉල්ලීම් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථාපිත කොට ඇති අමාත්‍යාංශ තාක්ෂණ කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමෙන් පසු අවසර පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරනු.

ඇමුණුම VII

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
# கமநல அபிவிருத்தித் திணைக்களம்
# DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/11/4/45(චක්‍රලේඛ)

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018.05.17

28 MAY 2018

චක්‍රලේඛ අංක : 10 / 2018

සියළුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් හා

සියළුම ගොවිජන සේවා කාරක සභා විධායක ලේකම්වරුන් වෙත

**මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛණයක ඇතුලත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත ගොඩ ඉඩම් ලේඛණයට ඇතුලත් කිරීම හා යම් ඉඩමක් කෘෂිකාර්මික ඉඩමක් නොවන බව ප්‍රකාශ කිරීම.**

"මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛණයක ඇතුලත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත ගොඩ ඉඩම් ලේඛණයට ඇතුලත් කිරීම" යන මාතෘකාව යටතේ 2018.04.20 දිනෙන් නිකුත් කරන ලද 05/2018 චක්‍රලේඛය හා බැඳේ.එම චක්‍රලේඛයේ "ගොඩ ඉඩම් ලේඛණ" යනුවෙන් සඳහන් වන සියළුම ස්ථාන වල "කෘෂිකාර්මික (ගොඩ) ඉඩම් ලේඛණ" ලෙස වෙනස්විය යුතු බවත්, එම චක්‍රලේඛයේ "ගොඩ ඉඩමක්" ලෙස අදහස් කරන ලද්දේ "කෘෂිකාර්මික (ගොඩ) ඉඩමක්" බවත් මෙයින් දැනුම් දෙමි.

කිසිදු කෘෂිකාර්මික ලේඛණයක ඇතුලත්ව නොමැති, එසේම කෘෂිකාර්මික නොවන ගොඩ ඉඩම් (උදා:- කාර්යාල පරිශ්‍ර, ඉන්ධන පිරවුම්හල් ආදි) සම්බන්ධයෙන් වන ඉල්ලීම් 05/2018 චක්‍රලේඛයේ ආවරණය නොවන අතර, එවැනි ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නම්, ඒ සඳහා 5/2018 චක්‍රලේඛයේ ඇමුණුම - 1 ආකෘතිය වෙනුවට මෙම චක්‍රලේඛයේ ඇමුණුම - 5 **(DAD/NA/2018/1)** ආකෘතිය පුරවා, ඇමුණුම - 6 ගැලීම් සටහනට අනුව ක්‍රියා කොට, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන මෙන් වැඩිදුරටත් උපදෙස් දෙමි.

"ගෙවතු" කෘෂිකාර්මික ඉඩම් ලෙස සලකා ක්‍රියාකල යුතු අතර, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ මෙම දෙපාර්තමේන්තුවේ වගකීම් යටතට ගැනෙන්නේ කුඹුරු ඉඩම්, කෘෂිකාර්මික ගොඩ ඉඩම් හා ජලමූලාශ්‍ර පිහිටා ඇති ඉඩම් පමණක් බවද වැඩිදුරටත් සඳහන් කරමි.


ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ. பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, NO. 42, SIR MARCUS FERNANDO MAWATHA, P. O. BOX 537, COLOMBO 07.
දුරකථන/தொலைபேசிகள்/Telephones :
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 2694231, 2694232, 2694233, 2694234
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 2691060
ෆැක්ස් / தொலை நகல் / Fax: 2693572, 2691843, 2674481
E-mail : commissionerdad@yahoo.com
විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

මහවැලි බලප්‍රදේශ සඳහා 5/2018 චක්‍රලේඛය මෙන්ම මෙම චක්‍රලේඛ උපදෙස් අදාල නොවන අතර, මහාවාරිමාර්ග බල ප්‍රදේශ වල පිහිටා ඇති ඉඩම් සම්බන්ධයෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව පමණක් ඊට අදාල ඉදිරිකටයුතු සිදුකරනු ලබන බව ද එසේම, විශේෂ සංරක්ෂණ කලාපය තුල පිහිටා ඇති ඉඩම් සම්බන්ධයෙන් ඊට අදාල ඉදිරිකටයුතු සිදුකිරීමේ වගකීම මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත, අදාල සංරක්ෂණ කලාපය පිළිබඳ වගකීම දරණ රාජ්‍ය ආයතනය විසින් සිදුකලයුතු බවද වැඩිදුරටත් සඳහන් කරමි.

එසේම මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිළි කිරීමක් අවශ්‍ය වේ නම්, ඒ සඳහා මා අමතන මෙන් ද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත්:-

1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
3. ලේකම්, මහවැලි හා පරිසර අමාත්‍යාංශය
4. රාජ්‍ය ලේකම්
   කෘෂිකර්ම අමාත්‍යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල්
   කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්
   වාරිමාර්ග දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්
   මහවැලි සංවර්ධන අධිකාරිය
8. අධ්‍යක්ෂ ජනරාල්
   නාගරික සංවර්ධන අධිකාරිය
9. සභාපති
   ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය
10. සාමාන්‍යාධිකාරි
    මධ්‍යම පරිසර අධිකාරිය
11. සභාපති
    පතල් හා කැනීම් කාර්යාංශය
12. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - මේ සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැන්වත් කිරීම සඳහා
13. සියළුම නාගරික කොමසාරිස්වරුන් වෙත
14. සියළුම ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත
15. සියළුම වාණිජ බැංකු වෙත - මේ සම්බන්ධයෙන් සියළුම ශාඛා කළමනාකරුවන් දැනුවත් කිරීම සඳහා.
16. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිළධාරීන් වෙත
17. සියළුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත

ඇමුණුම VIII

**ගොවිජන සංවර්ධන පනතේ 28 වගන්තිය යටතේ අවසර ලබාගෙන කුඹුරු ඉඩම් ගොඩකිරිම**

---

(i) අරණායක ගෙවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් මෝරාගම්මන වසමේ පිහිටි අක්කර 01 රූඩ් 01 ක් වූ පල්කුඹුර නැමැති කුඹුර සහ රූඩ් 01 පර්.38.68 ක් වූ ගොඩහත්ලාහ නැමැති කුඹුර යන කුඹුරු ඉඩම් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ 2017 ජනවාරි 09 දිනැති අංක 7/11/9/KG/1558 හා 1559 දරණ බලපත්‍ර මඟින් කුඹුරු ඉඩම් නොවන බව ප්‍රකාශයට පත් කර තිබුණි. එහෙත් භෞතික පරීක්ෂාවේදී ඉහත කුඹුරු පිහිටි යායේ අනෙකුත් කුඹුරුවල වී වගා කර තිබූ බව අනාවරණය විය. එමෙන්ම ගොවිජන සංවර්ධන සභාව විසින් පවත්වාගෙන යන කුඹුරු ඉඩම් ලේඛණයේ ඉහත ඉඩම් වී වගා කරන කුඹුරු ඉඩම් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව ගොඩ ඉඩම් ලෙස ප්‍රකාශයට පත් කල අක්කර 01 යි රූඩ් 02 යි පර්චස් 38.68 ක් වූ කුඹුරු ඉඩම් ගොඩකිරීම සඳහා බලපත්‍ර ලබාදීම මතභේදාත්මක විය. ඉහත කුඹුරු ඉඩම් ගොඩකිරීමේදී ඉඩම් හිමිකරු විසින් යායේ පහල කුඹුරුවලට ජලය සපයන ඇල මාර්ග අවහිර වන අයුරින් පස් පුරවා ගොඩකර තිබූ බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේඡායාරූප පහත දැක්වේ.





(ii) අරණායක ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් එළඟිපිටිය වසමේ පිහිටි වදකහලියද්ද කුඹුරෙන් පර්චස් 20.1 ක් ගොඩ කිරීම සඳහා 2017 පෙබරවාරි 20 දිනැති අංක 7/11/21/KG/1877 දරණ ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබා දී තිබුණි. එහෙත් ගොවිජන සංවර්ධන සභාවේ කුඹුරු ඉඩම් ලේඛණයේ එකී ඉඩම කුඹුරක් ලෙස සටහන් කර තිබුණු අතර යායේ අනෙකුත් කුඹුරු වී වගා කර තිබූ බව 2017 දෙසැම්බර් 6 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(iii) ඉහත ගොවිජන සංවර්ධනසභා බල ප්‍රදේශයට අයත් දෙබත්ගම පල්ලෙබාගේ වසමේ පිහිටි දෙල්දෙණිය කුඹුරෙන් පර්චස් 10 ක් ගොඩ කිරීම සඳහා 2017 ඔක්තෝබර් 10 දිනැති අංක 7/11/21/KG/1974 දරණ ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබා දී තිබුණි. එහෙත් ගොවිජන සංවර්ධන සභාවේ කුඹුරු ඉඩම් ලේඛණයේ එකී ඉඩම කුඹුරක් ලෙස සටහන් කර තිබුණු අතර යායේ අනෙකුත් කුඹුරු වී වගා කර තිබූ බව 2017 දෙසැම්බර් 6 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(iv) අඹේපුස්ස ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තෝලංගමුව වසමේ පිහිටි දුනුමඩලාව කුඹුරෙන් පර්චස් 10 ක්, 2017 පෙබරවාරි 23 දිනැති අංක CG/0107/පොදු දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මගින් කුඹුරු ඉඩමක් නොවන බව ප්‍රකාශයට පත්කර තිබුණි. එහෙත් 2018 අප්‍රේල් 17 දින ඉහත ඉඩමේ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එය වී වගා කල හැකි ජලය සහිත කුඹුරු ඉඩමක් බව අනාවරණය විය. මෙම ඉඩම ගොවිජන සංවර්ධන සභාවේ කුඹුරු ඉඩම් ලේඛණයේද කුඹුරු ඉඩමක් ලෙස ඇතුලත් කර තිබුණි. මෙම කුඹුරු ගොඩකිරීමේදී ජල මාර්ගයට අඩි 1 ½X 1 ½ පමණ කාණුවක් සකස් කර ඒ මත පස් දමා ගොඩකර තිබුණි. එමෙන්ම කුඹුර වටා බැම්මක්ද ඉදිකර තිබුණි. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(v) ඉහත ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තෝලංගමුව වසමේ පිහිටි තලහිටියාව කුඹුරෙන් රූඩ් 1 යි පර්චස් 9.7 ක ප්‍රමාණයක් , 2017 පෙබරවාරි 06 දිනැති අංක CG/002/පොදු දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මගින් කුඹුරු ඉඩමක් නොවන බව ප්‍රකාශයට පත්කර තිබුණි. එහෙත් 2018 අප්‍රේල් 17 දින ඉහත ඉඩමේ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එය වී වගාකල හැකි කුඹුරක් බව නිරීක්ෂණය විය. මෙම ඉඩමේ බස්නාහිර මායිමේ හා දකුණු මායිමේ වී වගාව සඳහා සකස් කල කුඹුරු දෙකක් දක්නට ලැබුණු අතර ගොවිජන සංවර්ධන සභාවේකුඹුරු ඉඩම් ලේඛණයේද මෙම ඉඩම කුඹුරක් ලෙස සඳහන් කර තිබුණි. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(vi) ඉහත ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තෝලංගමුව වසමේ පිහිටි දාන්ඩාව කුඹුරෙන් පර්චස් 65 ක ප්‍රමාණයක්, 2017 ජනවාරි 30 දිනැති අංක 07/11/10/KG/1103 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මඟින් කුඹුරු ඉඩමක් නොවන බව ප්‍රකාශයට පත් කර තිබුණි. එහෙත් 2018 අප්‍රේල් 17 දින ඉහත ඉඩමේ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එය වී වගා කල හැකි වගුරු බිමක් බව අනාවරණය විය. ඉඩමට දකුණු දෙසින් ගලායන ඇල මාර්ගයේ හොඳින් ජලය ගලා බසිමින් තිබුණු අතර, එහි ඉදිකර තිබූ අමුණ හරහා මෙම කුඹුරට පහසුවෙන් ජලය ලබා ගත හැකි බවද අනාවරණය විය. දැනට වල් බිහිවී ඇති මෙම කුඹුර ගොඩකිරීම නිසා පහල කුඹුරු යායට ජලය ලබාගැනීමට නොහැකිවනු ඇත. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(vii) පරගම්මන ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් මීපිටිය වසමේ පිහිටි මල්ගහමුල අස්වැද්දුම නැමැති පර්චස් 23.5 කප්‍රමාණයෙන් යුතු කුඹුර, 2017 ජනවාරි 23 දිනැති අංක 7/11/6/17/1/12/1859 දරන බලපත්‍රය මඟින් වී වගා කිරීමක් හැර වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීමට අවසර ලබා දී තිබුණි. ඉහත ගොඩකිරීම සම්බන්ධයෙන් සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී එම ස්ථානය ජාත්‍යන්තර පාසලක් පිහිටි ස්ථානයක් බව අනාවරණය විය. මෙම ජාත්‍යන්තර පාසල, අදාල කුඹුරු ගොඩකිරීම් සඳහා බලපත්‍ර ලබා ගැනීමට අවුරුදු 10 කටත් පෙරදී ඉදිකල ඉදිකිරීමක් බව අනාවරණය විය. පසුව 2017 වර්ෂයේදී එම ස්ථානය කුඹුරු ඉඩමක් නොවන බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉහත බලපත්‍රයේ දෙවන ඡේදය මඟින් ප්‍රකාශයට පත්කර තිබුණි. මෙම ගොඩකිරීම නිසා ඇල මාර්ගය අවහිර වී ඇති අතර පහල කුඹුරු යාය සම්පූර්ණයෙන්ම පුරන් වී ඇති බවද නිරීක්ෂණය විය. මෙවැනි අනවසර ඉදිකිරීම් සඳහා බලපත්‍ර ලබාදීම තුලින් කුඹුරු ඉඩම් ගොඩකිරීම සඳහා විශාල පිටුවහලක් ලැබී ඇති බවද නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(viii) ඉහත ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් මීපිටිය වසමේ පිහිටි රූඩ් 02 ක් වූ මුන්තෙට්ටුව නැමැති කුඹුරුඉඩම, 2017 ජනවාරි 03 දිනැති අංක 7/11/21/KG/1839 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මඟින් කුඹුරු ඉඩමක් නොවන බව ප්‍රකාශයට පත්කර තිබුණි. මෙම කුඹුරු කාලයක සිට පුරන් වීමට ඉඩහැර පසුව ඉහත බලපත්‍රය මඟින් කුඹුරු ඉඩමක් නොවන බව ප්‍රකාශයට පත් කර ඇති බව ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. ඇල මාර්ග අවහිර වීම නිසා යාබද කුඹුරු පුරන් වී ඇති බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.

 

ඉහත ගොඩකිරීම්වලට අමතරව වී වගා කල හැකි කුඹුරු ඉඩම් කුඹුරු නොවන බවට බලපත්‍ර මඟින් ප්‍රකාශයට පත්කර තිබුණු අවස්ථා පහත දැක්වේ.

| ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය | කෘ.ප.නි.ස. වසම | කුඹුරේ නම | බලපත්‍රයේ දිනය | බලපත්‍ර අංකය | ඉඩම් ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| අඹේපුස්ස | තෝල්ංගමුව | ලැයිම කුඹුර | 2017 ජනවාරි 30 | 7/11/21/KG/1838 | රූඩ් 1 යි පර්චස් 6.7 | වී වගා කල හැකි කුඹුරකි. |
| අඹේපුස්ස | පිලාඩුව | කොස්ගහකුඹුර | 2017 පෙබරවාරි 09 | 7/11/10/ KG/1278 | පර්චස් 06 | එම |
| එම | මාහේන | කැටවල දෙණියේ කුඹුර | 2017 දෙසැම්බර් 18 | 7/11/10/ KG/1169 | පර්චස් 10 | එම |
| එම | අල්ගම ඉහලගම | පිටියගෙ වෙලේ කුඹුර | 2017 පෙබරවාරි 21 | CG/002/පොදු | පර්චස් 78.2 | එම |
| එම | තෝල්ංගමුව | බටදොඹගහලියද්ද | 2017 පෙබරවාරි 06 | CG/002/පොදු | පර්චස් 34.12 | එම |
| එම | ගොඩවෙල | පොනවල කුඹුර | 2017 පෙබරවාරි 09 | CG/111/පොදු | පර්චස් 20 | එම |
| එම | ගොඩවෙල | ගලගාව කුඹුර | 2017 පෙබරවාරි 09 | CG/108/පොදු | පර්චස් 31.75 | එම |
| එම | තෝල්ංගමුව | තලහිටියාව පහල කුඹුර | 2017 පෙබරවාරි 13 | CG/159/පොදු | පර්චස් 10 | එම |
| එම | දුම්මලදෙණිය | කැබැල්ලගහකුඹුර | 2016 මාර්තු 23 | 7/11/6/ KG/25/456 | පර්චස් 26.6 | එම |

ඇමුණුමIX

**බලපත්‍ර මත සිදුකල මතභේදාත්මක ගොඩකිරීම්**

**-----------------------------------------------------**

(i) අරණායක ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ තල්ගස්පිටිය මුස්ලිම්ගම වසමේ කහටකහකුඹුර, පනපුරේ මහ කුඹුර වෙල, තම්මැට්ටයාගේ කුඹුර සහ පනපුරේ කුඹුර යන කුඹුරුවලින් පර්චස් 50 ක කොටසක් 2016 වර්ෂයේදී මුස්ලිම් පල්ලියක් ඉදිකිරීම සඳහා අනවසරයෙන් ගොඩකර තිබුණි. ඉහත අනවසර ගොඩකිරීම නිත්‍යානුකූල කර ගැනීම සඳහා 2017 පෙබරවාරි 16 දිනැති අංක 7/11/10/KG/1304 දරන බලපත්‍රය ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් වෙතින් පසුව ලබාගෙන තිබුණි. එහි සඳහන් වනුයේ මුස්ලිම් පල්ලියක් ඉදිකිරීම සඳහා අදාල කුඹුරු කොටස ගොඩකිරීමට අවසර ලබාදෙන බවයි. එහෙත් පල්ලියක් ඉදිකිරීම සඳහා ආරම්භ කිරීමක් හෝ සිදුකර නොතිබුණු බව 2017 දෙසැම්බර් 08 දින අදාල ස්ථානයේ සිදු කල ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ගොඩකල කොටසේ එක් බිම් කොටසක් තාවකාලිකව ක්‍රිඩා පිටියක් ලෙස යොදාගෙන තිබූ අතර ඉතිරි කොටස වල් බිහි වී තිබුණි. අදාල ස්ථානයේ හා පුරන් වූ කුඹුරුවල ඡායාරූප පහත දැක්වේ.





(ii) අඹේපුස්ස ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් තෝල්ලංගමුව වසමේ පිහිටි මොරහිටියාව කුඹුර හරහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකර ගැනීම සඳහා පර්චස් 9.5 ක ප්‍රමාණයක් 2018 පෙබරවාරි 13 දිනැති අංක 7/11/10/KG/1925 දරන බලපත්‍රය මගින් අවසර ලබාදී තිබුණි. 2018 අප්‍රේල් 17 දින ඉහත කුඹුරේ සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී එය හොඳින් වී වගා කල හැකි ජලය සහිත කුඹුරු ඉඩමක් බව අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.



(iii) ඉහත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් නිවටුව වසමේ පිහිටි වලම්ණියා කුඹුරෙන් ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම සඳහා පර්චස් 2.3 ක් ගොඩකර ගැනීමට 2017 දෙසැම්බර් 19 දිනැති අංක 7/11/21/KG/1844 දරන බලපත්‍රය මගින් අවසර ලබාදී තිබුණි. මෙම ඉඩමද වී වගාකල හැකි කුඹුරු ඉඩමක් බව නිරීක්ෂණයවිය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.



(iv) ඉහත ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් වරකාපොල වසමේ පිහිටි තණකිරිගල අස්සැද්දුම කුඹුරෙන් පර්චස් 6 ක් ගොඩකර ගැනීම සඳහා 2016 අප්‍රේල් 20 දිනැති අංක 7/11/10/KG/906 දරන බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණි. එම අවසර පත්‍රය අනුව ඉඩම ගොඩකිරීම සඳහා අවසර ලබාදී තිබුණේ වෛද්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වුවත්, 2018 අප්‍රේල් 17 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම ඉඩම වී වගාකල හැකි කුඹුරු ඉඩමක් බව නිරීක්ෂණය විය. මෙම ඉඩම ගොවිජන සංවර්ධන සභාවේ කුඹුරු ඉඩම් ලේඛනය අනුව කුඹුරු ඉඩමක් බවද අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.



(v) දැදිගම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයේ දැදිගම කොට්ඨාශයේ පිහිටි තොටදෙණියේ කුඹුර නැමැති කුඹුරු ඉඩමෙන් ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම සඳහා පර්චස් 5.6 ක්, 2015 මාර්තු 13 දිනැති අංක 7/11/10/KG/695 බලපත්‍රය මඟින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් අවසර ලබා දී තිබුණි. 2018 අප්‍රේල් 19 දින අදාල ස්ථානයේ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම කොටස හොඳින් වී වගා කල හැකි කුඹුරු ඉඩමක් බව අනාවරණය විය. දෙපස කුඹුරුද හොඳින් වගා කල හැකි ජල වහනය සහිත කුඹුරු බව අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.



ඇමුණුමX

**අවසර ලබාගත් ප්‍රමාණය ඉක්මවා ගොඩකිරීම්**

**--------------------------------------------------**

(i) අරණායක ගොවිජන සංවර්ධන සභා බලප්‍රදේශයට අයත් මෝරාගම්මන වසමේ පල්කුඹුර නැමැති කුඹුරේ පර්චස් 06 ක් නිවසක් ඉදිකිරිම සඳහා ගොඩකර ගැනීමට ඉඩමේ හිමිකරු වෙත 2016 ඔක්තෝබර් 04 දිනැති අංක 7/11/10/KG/908 දරන බලපත්‍රයමඟින් අවසර ලබා දි තිබුණි. විගණන අවස්ථාව වන විට මොහු විසින් මෙම කුඹුරේ පර්චස් 30 ක් පමණ පස් පුරවා වාරි ඇල වැසෙන ලෙස ගොඩකර නිවස ඉදිකරමින් පවතින බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(ii) අරණායක ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් එළගිපිටිය වසමේ අස්සැද්දුම නැමති කුඹුරේ පර්චස් 10 ක ප්‍රමාණයක් නිවසක් ඉදිකිරීම සඳහා ගොඩකර ගැනීමට ඉඩමේ හිමිකරු වෙත 2016 දෙසැම්බර් 02 දිනැති අංක 7/11/16/ KG/1700 දරන බලපත්‍රය මඟින් අවසර ලබා දී තිබුණි. එහෙත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ ඔහු විසින් කුඹුරු යාය මැද පස්පුරවා දෙපස බැමි යොදා පර්චස් 25 ක පමණබිම් කොටසක් ගොඩකර නිවස ඉදිකර ඇති බවයි. කුඹුරු වලින් ජලය බැස යන ඇල මාර්ගයද අවහිර වන අයුරින් ඉඩම ගොඩකිරීම නිසා දෙපස ජලය රැඳී ඇති බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.

 

(iii ) අරණායක ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් නාරංගම්මන වසමේ පිහිටි උඩදන් කුඹුරේ පර්චස් 10 ක් ගොඩකර ගැනීම සඳහා 2016 ඔක්තෝබර් 03 දිනැති අංක 7/11/10/KG/993 දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබාදී තිබුණි. එම ස්ථානයේ සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී පර්චස් 40 ක පමණ ප්‍රමාණයක් ගොඩකර තිබූ බව නිරීක්ෂණය විය. පර්චස් 25 ක පමණ ප්‍රමාණයක නිවස ඉදිකර තිබුණි. අදාල ස්ථානයේ ඡායාරූපපහත දැක්වේ.

 

(iv) අරණායක ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ දෙබත්ගම උඩබාගේ කෘ.ප.නි.ස වසමේ පිහිටි රයිමලේ කුඹුර නැමැති කුඹුරු ඉඩමෙහි පර්චස් 10 ක් ගොඩකර ගැනීම සඳහා 2016 මැයි 18 දිනැති අංක 7/11/10/KG/964 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබාදී තිබුණි. එහෙත් ස්ථානීය පරීක්ෂාවේදී පර්චස් 70 ක් පමණ කොටසක් ගොඩකර තිබූ බව අනාවරණය විය. පර්චස් 20 ක පමණ කොටසක නිවස ඉදිකර තිබුණි. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.




(v) අඹේපුස්ස ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තෝලංගමුව වසමේ පිහිටි ලින්තොට කුඹුර නැමැති කුඹුරු ඉඩමෙන් පර්චස් 10 ක ප්‍රමාණයක් නිවසක් ඉදිකර ගැනීම සඳහා ගොඩකර ගැනීමට හිමිකරු වෙත 2016 අගෝස්තු 19 දිනැති අංක 7/11/10/KG/793 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාලගේ බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණු අතරපර්චස් 29.15 ක ප්‍රමාණයක් ගොඩකර තිබුණි. ඒ අනුව අවසර දුන් ප්‍රමාණය ඉක්මවා පර්චස් 19.15 ක් ගොඩකර තිබුණි. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.




(vi) දැදිගම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තුංතොට වසමේ තොට කුඹුර නැමැති කුඹුරු ඉඩමෙන් පර්චස් 8 ක ප්‍රමාණයක් නිවසක් ඉදිකිරීම සඳහා ගොඩකර ගැනීමට ඉඩමේ හිමිකරු වෙත 2016 අප්‍රෙල් 27 දිනැති අංක 7/11/10/KG/521 දරන බලපත්‍රය මඟින් අවසර ලබා දී තිබුණි. 2018 අප්‍රේල් 19 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී පර්චස් 20 ක ප්‍රමාණයක් ගොඩකර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පර්චස් 12 ක ප්‍රමාණයක් වැඩියෙන් ගොඩකර තිබූ බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.






(vii) ඉහත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් මොරවක වසමේ උණපඳුර ගාවා අස්සැද්දුම නැමැති කුඹුරෙන් පර්චස් 8 ක් නිවසක් ඉදිකිරීමට ගොඩකර ගැනීම සඳහා ඉඩමේ හිමිකුරු වෙත 2014 ජූලි 2 දිනැති අංක 7/11/1/KG/150 දරන බලපත්‍රය මඟින් අවසර ලබා දී තිබුණි. 2018 අප්‍රේල් 19 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී පර්චස් 16 ක ප්‍රමාණයක් ගොඩකර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පර්චස් 8 ක ප්‍රමාණයක් වැඩියෙන් ගොඩකර තිබූ බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.



ඇමුණුමXI

**අවිධිමත් බලපත්‍රමත ගොඩකිරීම්**

---

(i) බැම්ණිවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් බෙලිගම්මන කෘ.ප.නි.ස වසමේ පිහිටි පාඩාපොත කුඹුරෙහි පර්චස් 80.7 ක් ගොඩකර ගැනීම සඳහා 2017 පෙබරවාරි 09 දිනැති අංක CG/0100/පොදු දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබ ඇති බව සඳහන් බලපත්‍රයක් මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබාදී තිබුණි. එහෙත් 2017 සැප්තැම්බර් 27 දිනැති අංක D.A.D24/12/03 දරන බැම්ණිවත්ත ගොවිජන සංවර්ධන නිලධාරිගේ ලිපිය මඟින් ඉහත බල පත්‍රය විධිමත් පරිදි නිකුත් කරන ලද බල පත්‍රයක් නොවන බැවින් ගොඩකිරීම හා ඉදිකිරීම් කටයුතු නවත්වන ලෙස දැනුම් දී තිබුණි. එසේ තිබියදී ගොඩකිරීම් කටයුතු තවදුරටත් කරගෙන යන බව 2017 දෙසැම්බර් 15 වන දින සිදු කල ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(ii) බැම්ණිවත්ත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ බෙලිගම්මන වසමේ පිහිටි ගල්වඩුව කුඹුරෙහි පර්චස් 120.3 ක් ගොඩකර ගැනීම සඳහා 2017 පෙබරවාරි 03 දිනැති අංක CG/045/පොදු දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබ ඇති බව සඳහන් බල පත්‍රයක් මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබා දී තිබුණි. එහෙත් 2017 අගෝස්තු 02 දිනැති අංක DAD/24/12/03 දරන බැම්ණිවත්ත ගොවිජන සංවර්ධන නිලධාරීගේ ලිපිය මඟින් ඉහත බලපත්‍රය විධිමත් පරිදි නිකුත් කරන ලද බලපත්‍රයක් නොවන බව දැනුම් දී තිබුණි. එසේ තිබියදී අදාල කුඹුර වටේ කොන්ක්‍රීට් කර කුඹුර මැදින් කොන්ක්‍රීට් පාරක් ද ඉදිකර පර්චස් 20 බැගින් වූ බිම් කට්ටි 5 ක් අලෙවි කර තිබුණු බවද නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.

 

(iii) බැමිණිවත්ත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ඒ දඩුවාව වසමේ පිහිටි ඔකඳ කුඹුරෙහි පර්චස් 46.5 ක් ගොඩකර ගැනීම සඳහා 2017 පෙබරවාරි 08 දිනැති අංක CG/044/පොදු දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබ ඇති බව සඳහන් බලපත්‍රයක් මඟින් ඉඩමේ හිමිකරු වෙත අවසර ලබාදී තිබුණි. එහෙත් 2017 අගෝස්තු 02 දැනැති අංක DAD/24/12/03 දරන බැමිණිවත්ත ගොවිජන සංවර්ධන නිලධාරීගේ ලිපිය මඟින් ඉහත බල පත්‍රය විධිමත් පරිදි නිකුත් කරන ලද බලපත්‍රයක් නොවන බැවින් ගොඩ කිරීම් හා සංවර්ධන කටයුතු අත්හිටුවන ලෙස දැනුම් දී තිබුණි. එසේ තිබියදී ඉඩම ගොඩකර නිවසක්ද ඉදිකරමින් පැවති බව 2017 දෙසැම්බර් 15 දි සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.

 

ඉහත ගොඩ කිරීම්වලට අමතරව අවිධිමත් බලපත්‍ර යටතේ සිදු කල ගොඩකිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය | ග්‍රාම නිලධාරී/කෘ.ප.නි.ස වසම | හිමිකරුගේ නම | කුඹුරු ඉඩමේ නම | ගොඩකල ඉඩම් ප්‍රමාණය | බලපත්‍රයේ අංකය |
|---|---|---|---|---|---|
| -------------- | ------------------------ | --------------------- | ---------------------- | -------------------- | -------------------- |
| | | | | රූඩ්/පර්චස් | |
| බැමිණිවත්ත | මාවාන | එම්.ටී.එම්.ඉලාමුද්දි | හෝන්දෙනිගොඩ කෝපිවත්ත සහ පහළ හෝන්දෙණියේ කුඹුර | | CG/084/පොදු |
| එම | මාවාන | එන්.කේ.සී.දයාවතී | මීනුන් කුඹුර | ප.9.67 | CG/192/පොදු |
| එම | මාවාන | ඒ.එම්.ඒ.ෆස්ලි | ඇතුල්ලැව කුඹුර | ප.20 | CG/002/පොදු |
| එම | මහවත්ත | එම්.කේ.එම්.රහමතුල්ලා | අලබෝකොටුව හෙවත් උඩබෝකොටුව කුඹුර | රූ2 ප.16 | CG/002/පොදු |
| එම | රංකොත්දිවල | යූ.කේ.ජී.එස්.එල්.ජයකොඩි | මුවන් කුඹුර | ප.05 | CG/002/පොදු |
| එම | මුරුතවල | එච්.ඒ.දිල්හානි ලසන්තිකා | පහල අඹන්දෙනිය කුඹුර | ප.23 | CG/193/පොදු |
| එම | මුරුතවල | ජේ.පී.දිලාන් චාරක අබේවර්ධන | ආදාපාන අස්සැද්දුම කුඹුර | ප.20 | CG/154/පොදු |
| එම | රංකොත්දිවල | ඒ.එල්.යූ.රාලියා | අස්වැද්දුම කුඹුර | ප.40 | CG/050/පොදු |
| එම | මුරුතල | එච්.එම්.ටිකිරි මැණිකේ | කිඹුල්වක අස්වැද්දුම කුඹුර | ප.15 | CG/198/පොදු |
| එම | මහවත්ත | එස්.එච්.එම්.රාසික් | කරහින්න කියන කුඹුර | ප.12 | CG/002/පොදු |
| එම | ගොන්දිවල | එම්.එම්.එන්.අෂීමා | මුරුතනේ කුඹුර | ප.25.7 | CG/002/පොදු |

| | | | | | |
|---|---|---|---|---|---|
| යටිටෝගොඩ | බල්ලපාන පාතබාගේ | ඒ.ඩබ්.එල්.දිසානායක | උඩවැරැල්ල ඉන්දරාමුල්ල | ප.10 | CG/161/පොදු |
| එම | එම | ලෙස්ලි විජේශාන්ත | අගණුමුව කුඹුර | ප. 12.14 | CG/146/පොදු |
| එම | යටිටෝගොඩ | එස්.ලසන්ත ලක්මාල් | වැලි කුඹුර | ප.10 | CG/173/පොදු |
| එම | එම | ඩී.වී.සුසන්ත ලක්ෂ්මන් | වැලි කුඹුර | ප.26.5 | CG/084/පොදු |
| එම | බල්ලපාන උඩබාගේ | එස්.එස්.එන්.සදලිකා පතිරණ | වැලි කුඹුර | ප.44.61 | CG/075/පොදු |
| එම | බිසෝවෙල | කේ.ඒ.මල්ලිකා දිසානායක | පත්තොඩුවාව කුඹුර | ප.31.63<br>ප.59.08<br>ප.36.95 | 7/11/09/KG/1851 |
| එම | අටාල | කේ.දීපා කුමාරි | බරවේ කුඹුර | ප.18.09 | 7/11/09/KG/1568 |
| එම | යටිටෝගොඩ | කේ.ඒ.දේශප්‍රිය කරුණාගොඩ | වැලි කුඹුර | ප.10.12 | CG/002/පොදු |
| එම | බල්ලපාන පාතබාගේ | එම්.රණතුංග | අඹකොට පැල | ප.37.25 | CG/002/පොදු (අවලංගු කර ඇත) |
| එම | බල්ලපාන පාතබාගේ | ඩබ්.පී.ඩබ්.පීරිස් | අඹකොට පැල | ප.38.11 | CG/002/පොදු (අවලංගු කර ඇත) |
| එම | බල්ලපාන පාතබාගේ | ඩබ්.එම්.සංජීව විජයලත් | වැලිකුඹුර නොහොත් මිනුම් කුඹුර | | 7/11/01/KG/48 |
| එම | නාරංගොඩ | ආර්.එම්.ආර්.බී.හත්තාගොඩ | හීවැල් කුඹුර හා උනුමුමේ ලියද්ද | ප.198 | CG/060/පොදු |
| එම | දමුණුපොල | ඒ.ඒ.රත්නමාලා වනසිංහ | නැකතිගේ කුඹුර | ප.8.61 | 7/11/9/ KG /1580 |
| එම | අටාල | ඒ.එච්.එම්.අයි.කේ.අලහකෝන් | කැලඋල්ල | ප.16.00 | CG/141/පොදු |
| එම | රෑනපාන | ආර්.සී.ඒ.විජයරත්න | දේවතාපේඩිගේ ගලගාව | රූ.01 ප.0.83 | 7/11/21/KG/1848 |

ඇමුණුම XII

**යායේ අනෙකුත් කුඹුරුවල වී වගා කිරීම අවහිර වන ලෙස කරන ලද ගොඩකිරීම්**

--------------------------------------------------------------------------------

අරණායක ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ එළඹපිටිය වසමේ වදකහලියද්ද කුඹුර



බටුවත්ත ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ නවගමුව වසමේ ඉහළ කුඹුර



යටියන්තොට ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ බිසෝවෙල වසමේ පත්තොඩුවාව කුඹුර





ඇමුණුමXIII

**අනුමත ප්‍රමාණය ඉක්මවා කුඹුරු ඉඩම් ගොඩකිරීම සඳහා අවසර ලබාදීම**

---

i අරණායක ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ අරණායක ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි ගවරවිල කුඹුර නැමැති කුඹුරේ පර්චර්ස් 19.1 ක් නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමේ හිමිකරු වෙත 2017 පෙබරවාරි දින රහිත අංක 7/11/16/KG/1786 දරන බලපත්‍රය මඟින් අවසර ලබා දී තිබුණි.

ii අරණායක ගොවිජන සංවර්ධන බලප්‍රදේශයේ දෙබත්ගම උඩබාගේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි රයිමලේ කුඹුර නැමැති කුඹුරු ඉඩමේ පර්චර්ස් 36.31ක් නිවසක් ඉදිකිරීම සඳහා ගොඩකිරීමට 2016 සැප්තැම්බර් 02 දිනැති අංක 7/11/10/KG/1184 දරන බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණි.

iii යට්ටෝගොඩ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ අටාල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි බරවේ කුඹුර නැමැති කුඹුරේ පර්චර්ස් 18.9 ක නිවසක් ඉදිකිරීම සඳහා ගොඩකර ගැනීමට 2017 පෙබරවාරි 14 දිනැති අංක 7/11/9/KG/1568 දරන බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණි.

iv පරගම්මන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ගංතුන උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි වරක්තැන්නේ කුඹුර නැමැති කුඹුරු ඉඩමෙන් පර්චස් 31.15 නිවසක් ඉදිකිරීම සඳහා ගොඩකර ගැනීමට 2016 දෙසැම්බර් 14 දිනැති අංක 7/11/21/KG/1800 දරන බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණි.

v පරගම්මන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ පල්ලෙවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි කොත්තන්නාගොඩ කුඹුර සහ බණගෙයි ඕව්ටේ කුඹුර හෙවත් අස්සැද්දුම නැමැති කුඹුරු ඉඩමෙන් රූඩ් 2 පර්.01.40 ක් වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීමට 2015 ජනවාරි 12 දිනැති අංක 7/11/10/KG/504 දරන බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණි.

vi අඹේපුස්ස ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් තෝලංගමුව වසමේ පිහිටි හන්කෙන්දේ කුඹුර නැමැති කුඹුරෙන් පර්චස් 30.72 ක් ගොඩකර ගැනීම සඳහා 2017 පෙබරවාරි 01 දිනැති අංක 7/11/10/KG/1004 දරන බලපත්‍රය මඟින් අවසර ලබා දී තිබුණි. මෙම අවසරය ලබාදී තිබුනේ නිවසක් සහ කාර්මික ව්‍යාපාර ස්ථානයක් ඉදිකිරීම සඳහායි. 2018 අප්‍රේල් 17 දින සිදුකල භෞතික පරික්ෂාවේදී කුඹුර වටා බැම්මක් ඉදිකර ඉඩම ගොඩකරමින් පවතින බව නිරීක්ෂණය විය. කොටසක් වල් බිහිවී තිබුණු අතර අත්තිවාරම් දමා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. එහෙත් මෙම ඉඩම වී වගාකල හැකි ජල වහනය සහිත ඉඩමකි. යාබදව ඇල මාර්ගයක් ගලා යන බවද නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





vii ඉහත ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තෝලංගමුව වසමේ පිහිටි මීකොටුව කුඹුරෙන් පර්චස් 48 ක් ගොඩකර ගැනීම සඳහා 2016 ඔක්තෝබර් 01 දිනැති අංක 7/11/16/KG/1682 දරන බලපත්‍රය මඟින් අවසර ලබා දී තිබුණි. මෙම අවසරය ලබා දී තිබුනේ ඉන්ධන පිරවුම් හලක් ඉදිකිරීම සඳහා බව බල පත්‍රයේ සඳහන් වේ. එහෙත් 2018 අප්‍රේල් 17 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අදාල ඉඩම හොඳින් ජලය ලබාගත හැකි කුඹුරු ඉඩමක් බව අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.






viii ඉහත ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයේ තෝලංගමුව වසමේ පිහිටි හන්කොන්දා කුඹුර නැමැති කුඹුරෙන් පර්චස් 15 ක් ගොඩකර ගැනීම සඳහා 2017 ජනවාරි 11 දිනැති අංක 7/11/10/KG/652 දරන බලපත්‍රය මඟින් අවසර ලබාදී තිබුණි. මෙම අවසරය ලබාදී තිබුනේ නිවසක් ඉදිකිරීම සඳහායි. 2018 අප්‍රේල් 17 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම කුඹුර හොඳින් ජලය ලබාගත හැකි කුඹුරු ඉඩමක් බව අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.






ඇමුණුම XIV

**මුදාහරින අපද්‍රව්‍ය වලින් කුඹුරු විනාශ වීම**

-----------------------------------------------

අරණායක ගොවිජන සංවර්ධන බලප්‍රදේශයේ ගොඩිගමුව වසමේ වහලේ කුඹුර



අරණායක ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ අරණායක වසමේ ගවරවිල කුඹුර



**කිසිදු අවසරයක් නොලබා ගොඩකරනු ලැබූ කුඹුරු ඉඩම්**

(i) උස්සාපිටිය ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ලඹුටුව කෘ.ප.නි.ස වසමේ සේවයේ නියුතු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් ඔහුට අයත් ගම්මන්ගොඩ වසමේ පිහිටි කුඹුර ගොඩකර නිවසක් ඉදිකර පදිංචි වී තිබුණු අතර කුඹුරු ඉඩමේ ඉතිරි කොටස ස්ථිර භෝග වගා කර තිබුණි. එමෙන්ම මෙම නිවස පහල කුඹුරුවලට ජලය සැපයෙන ඇල මාර්ගය අවහිර වන අයුරින් ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





(ii) පනාවල ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ තිඹිරිපොල කෘ.ප.නි.ස වසමේ බෝගහ කුඹුර යායේ කුඹුරවලට ජලය සපයන ඇල මාර්ගය අවහිර වන අයුරින් මාර්ගයක් ඉදිකිරීම සඳහා ගොඩකර තිබුණි. මෙම ඉදිකිරීම ඉඩම් හිමියාගේ, අඳ ගොවියාගේ සහ කෘ.ප.නි.ස නිලධාරිගේ විරුද්ධත්වය නොතකා ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





ඉහත ගොඩකිරීම්වලට අමතරව එවැනි අනවසර ගොඩකිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය | කෘ.ප.නි.ස වසම | ඉඩමේ හිමිකරු | ඉඩමේ නම | අනවසර ක්‍රියාව |
| --- | --- | --- | --- | --- |
| පරගම්මන | දික්කොහුපිටිය | එච්.එම්.සුනිල් ප්‍රියන්ත මල්වාන | දික්කොහුපිටි යාය | කෙසෙල් වගා කිරීම |
| එම | ගංතුන දකුණ | ඒ.පී.සයිමන් | උඩපිටිය යාය | කෙසෙල් වගා කිරීම |
| එම | ගොලහැල | ටී.එම්.සුමනාවතී මැණිකේ | වී දෙපැල පල්ලහ | කුඹුර මැදින් කටු කම්බි ගසා කොන්ක්‍රීට් කණු සිටුවා කටු කම්බි ගසා තිබීම |
| | | ජී.යූ.අයි.යසරත්න | දෙපැල පල්ලහ | |
| එම | මීපිටිය | බී.එස්.තිලකසිරි | රද්දල යාය | පස් දමා නිවසක් ඉදිකිරීම |
| | | සිරිරත්න මාරිසිංහ | කෝන්ගහ හෙවත් කොහොලාගේ කුඹුර | |
| එම | කරඩුපන | පී.පී.ඩේසි | ඉහල වැලි කුඹුර | කෙසෙල් වගාව |
| | | එස්.පී.වසන්ත උදයසිරි සමරසිංහ | පාත වැලි කුඹුර | කෙසෙල් වගාව |
| | | ඩී.පී.වසන්ත කුමාර | පාත වැලි කුඹුර | කෙසෙල් වගාව |
| එම | නිල්මල්ගොඩ | ජී.ජනක නිශාන්ත සමරතුංග | කුඩා හිටිගේ කුඹර | අනවසර බැකෝ කිරීම |
| එම | පල්ලේවෙල | ජේ.පී.අබේරත්න | ඌරාකොටේ කුඹුර | අත්තිවාරම් දමා ඇත. |
| එම | පරගම්මන | ලාල් සුසන්ත | පන්වත්ත කුඹුර | කුඹුරට පස් දමා ඇත. |
| එම | බෙලිහුල්වාන | එච්.ආර්.සෙනවිරත්න | අටලාහ කුඹුර | මඤ්ඤොක්කා වගාව |
| එම | කළුගල්ල | එල්.ආර්.ධනුෂ්ක ලක්මාල් | මූණමල්ගහමුල අස්සැද්දුම පිල්ලෑව හෙවත් පහලහේන | බැකෝ යන්ත්‍රයක් යොදාගෙන මට්ටම් කිරීම |
| එම | අලපලාවල | ඩී.පී.රණසිංහ | රදාගේ ලියද්ද | පස් පිරවීම හා කුඩා නිවසක් හා පැල තවානක් |
| එම | අඹන්පිටිය | රංවල පුරාණ විහාරය | ඉහල මහරඹ | කොන්ක්‍රීට් කණු සිටුවීම |

| | | | | |
|---|---|---|---|---|
| එම | ඇවුණුගල්ල | කේ.ඒ.ආර්.බණ්ඩාර | ඉඩම්ගහදෙණිය හෙවත් තුනදෙණියේ කුඹුර | පස් දැමීම හා කෙසෙල් වගාව |
| බැම්ණිවත්ත | උතුවන්කන්ද | පී.එච්.ජී.ගුණව( | ලිඳ කුඹුර,හදනා කුඹුර හා ලිඳ මුල කුඹුර | අනවසරයෙන් පස් පුරවා පාරක් සෑදීම |
| එම | කිරිංගදෙනිය | එම්.එෆ්.එම්.ෂාහිම් | තඹලුවාව කුඹුර දැනට වත්ත | අනවසර ඉදිකිරීම් |
| එම | යටිමහන | කේ.ජී.ටී.ආර්.බී.කෝරලගේ | නුවර ගෙදර වත්ත හෙවත් හිටිනා වත්ත | අනවසර ඉදිකිරීම් |
| එම | හබ්බුන්කඩුව | එම්.නිමල් වීරසිරි පෙරේරා | ඔයගාව අසුවැද්දුම | අනවසර පස් පිරවීමක් |
| එම | හෙම්මාතගම | එච්.නිමල් සේනාරත්න | බෙරඹතලාව කුඹුර | අනවසර ඉදිකිරීම් |
| එම | පල්ලිපෝරුව | ලාල් ජයන්ත බණ්ඩාර | උණුම් කුඹුර | අනවසර ඉදිකිරීම් |
| එම | පල්ලිපෝරුව | ඩී.ආර්.අශෝක දෙහිගම | රදා කුඹුර නොහොත් පල් කුඹුර | අනවසර පස් පිරවීමක් |
| එම | පල්ලිපෝරුව | ජී.ආර්.ගුණතිලක | උණුම් කුඹුර | අනවසරයෙන් කුඹුරු ඉඩමට පස් පිරවීම |
| එම | රංකොත්දිවල | එම්.එච්.එම්.නවාස් | ගොඩපැල කුඹුර | අනවසර ඉදිකිරීම් |
| එම | උතුවන්කන්ද | සේනක බණ්ඩාර | කෙටලපත දෙණිය කුඹුර | අනවසර ඉදිකිරීම්, අනවසර පස් පිරවීම |
| එම | කැප්පෙටිපොල | පී.ඒ.ජී.රත්නායක | පල්ලේගලහිටියාව කුඹුර | අනවසර ඉදිකිරීම් |

ඇමුණුම XVI

**1990 සිට 2017වර්ෂය දක්වා කෑගල්ල දිස්ත්‍රික්කයෙහි වී වගා කල කුඹුරු ඉඩම් පිළිබඳ දත්ත (හෙක්ටයාර්)**

| වර්ෂය | කන්නය | | එකතුව |
|---|---|---|---|
| | යල | මහ | |
| 1990 | 10,924 | 11,143 | 22,066 |
| 1991 | 10,933 | 11,059 | 21,992 |
| 1992 | 10,747 | 11,029 | 21,776 |
| 1993 | 10,736 | 10,903 | 21,639 |
| 1994 | 10,154 | 10,923 | 21,077 |
| 1995 | 10,642 | 10,911 | 21,552 |
| 1996 | 7,207 | 10,899 | 18,106 |
| 1997 | 9,728 | 10,901 | 20,630 |
| 1998 | 5,680 | 10,218 | 15,898 |
| 1999 | 8,884 | 10,184 | 19,068 |
| 2000 | 5,534 | 10,004 | 15,538 |
| 2001 | 6,286 | 9,115 | 15,400 |
| 2002 | 7,603 | 9,351 | 16,954 |
| 2003 | 8,523 | 9,082 | 17,605 |
| 2004 | 6,579 | 8,850 | 15,429 |
| 2005 | 7,774 | 8,922 | 16,696 |
| 2006 | 5,471 | 8,777 | 14,247 |
| 2007 | 5,159 | 8,233 | 13,392 |
| 2008 | 7,431 | 7,486 | 14,917 |
| 2009 | 7,617 | 8,179 | 15,796 |
| 2010 | 7,216 | 8,337 | 15,553 |
| 2011 | 7,024 | 8,212 | 15,236 |
| 2012 | 2,882 | 7,103 | 9,985 |
| 2013 | 2,882 | 5,093 | 7,975 |
| 2014 | 3,969 | 6,088 | 10,057 |
| 2015 | 4,723 | 6,240 | 10,963 |
| 2016 | 2,662 | 5,757 | 8,419 |
| 2017 | 1,676 | 3,691 | 5,367 |

**වී අස්වැන්න පිළිබඳ දත්ත (000 මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | කන්නය | | එකතුව |
|---|---|---|---|
| | යල | මහ | |
| 1990 | 26.8 | 37.5 | 64.3 |
| 1991 | 25.7 | 35.8 | 61.5 |
| 1992 | 28.9 | 34.4 | 63.3 |
| 1993 | 30.9 | 38.7 | 69.5 |
| 1994 | 27.6 | 35.8 | 63.4 |
| 1995 | 25.3 | 37.9 | 63.3 |
| 1996 | 18.7 | 35.9 | 54.7 |
| 1997 | 26.2 | 37.2 | 63.4 |
| 1998 | 12.4 | 32.9 | 45.2 |
| 1999 | 25.4 | 31.9 | 57.3 |
| 2000 | 14 | 34.8 | 48.8 |
| 2001 | 17.3 | 22.9 | 40.2 |
| 2002 | 20.5 | 35.4 | 55.9 |
| 2003 | 22.7 | 27.7 | 50.1 |
| 2004 | 19.9 | 21.1 | 40.9 |
| 2005 | 22.3 | 28.4 | 50.8 |
| 2006 | 16 | 33.2 | 49.2 |
| 2007 | 15.6 | 24.2 | 39.8 |
| 2008 | 23.1 | 26 | 49.1 |
| 2009 | 24.1 | 28.2 | 52.2 |
| 2010 | 19.2 | 29.6 | 48.8 |
| 2011 | 18.1 | 23 | 41.1 |
| 2012 | 5.8 | 24 | 29.8 |
| 2013 | 12.2 | 18.7 | 30.8 |
| 2014 | 10.2 | 18.6 | 28.8 |
| 2015 | 15.1 | 22.3 | 37.4 |
| 2016 | 7.6 | 21.0 | 28.6 |
| 2017 | 4.4 | 7.0 | 11.4 |

ඇමුණුම XVIII

**නිරීක්ෂණය වූ පාරිසරික හානි**

**------------------------------**

පනාවල ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයට අයත් තල්දූව නගරය අවට කුඹුරු ඉඩම් ගොඩකර සතිපොළ හා කඩසාප්පු ඉදිකිරීම නිසා සුළු වර්ෂා තත්වයකදී පවා තල්දූව නගරය ජලයෙන් යටවන බව අනාවරණය විය. අදාල ස්ථානයේ ඡායාරූප පහත දැක්වේ.





තල්දූව සති පොළ





වාරි ඇළ හරස්කල ඉදිකර ඇති කඩසාප්පු